**මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------**

මහ කොළඹ අපජලය කළමනාකරණය ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 සහ අංක 2558 දරන ණය ගිවිසුම්වල 5 වන උපලේඛනයේ 27 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම්වලට අනුව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5 ක නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) වත්කම් කළමණාකරනය, මූල්‍ය කළමණාකරනය, මෙහෙයුම් කාර්යසාධනය නියාමනය, පාරසරික නියාමන අනුකූලතාවය, පාරිභෝගික සේවා සහ නිසි සනීපාරක්ෂක සේවා සැපයීමේදී ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11 කට සමාන එජඩො මිලියන 110.24 ක් වන අතර ඉන් රු.මිලියන 10,783.63 කට සමාන එජඩො මිලියන 94.37 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යායනය කිරීමට එකඟවී තිබූ අතර ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46 කට සමාන එජඩො මිලියන 15.87 ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යානය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| -------------- | -------------------- | ------- | --------------- | ------------- |
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. තවද කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේවෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. | නීතිමය අවශ්‍යතාවයන් කඩවී ඇත. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද ණය නියෝජිතායතනය මඟින් සපයන ලද රු.මිලියන 10,783.65 කට සමාන එ.ජ.ඩො මිලියන 94.37 ක ප්‍රතිපාදනයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,417.30 කට සමාන එ.ජ.ඩො. මිලියන 70.88 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව අනාවරණය විය. ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඉතිරි මාස 12 ක කාලපරිච්ඡේදය තුලදී මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ සැකයක් පැවතුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | විගණන ගැටළුව | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | -------------- | -------------------- | | -------- | ------------------- | ------------ |
| | **මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම** | | | | | |
| (අ) | වනාතමුල්ල ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය වැඩිදියුණු කිරීම | කොන්ත්‍රාත්කරු කටයුතු අවසන් කිරීමකින් තොරව වැඩබිමෙහි කටයුතු නතර කිරීම හේතුවෙන් කොන්ත්‍රාතුව 2017 ජුනි 30 දින අවසන් කර ඇත.ඉතිරි කටයුතු අවසන් කිරීමට පියවර ගෙන නොතිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට සියයට 68 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. | | කොන්ත්‍රාත්තුව සඳහා අමතර පිරිවැය දැරීම සහ සැලසුම් කළ කටයුතු නිම කිරීමේ ප්‍රමාදයන් සිදුවීම. | **විවලතා විධානයක් මගින් වනාතමුල්ලේ** ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය වැඩිදියුණු කිරීම අපවහන කටයුතු සිදුකරමින් පවතින කොන්ත්‍රාත්කරුවකුට වෙත ප්‍රදානය කිරීමට නියමිතය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නිසි නියාමනය සහ අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් අඛණ්ඩ අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |
| (ආ) | පොම්පාගාර 8ක් සහ **ප්‍රධාන පොම්පාගාර** 03 ක් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ පුනරුත්තාපනය කිරීම. | කොළඹ නගරයේ පොම්පාගාර 8ක් සහ **ප්‍රධාන පොම්පාගාර** 3ක් පුනරුත්ථාපනය සඳහා 2015 ජුලි කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර 2018 පෙබරවාරි 26 දිනට අවසන් කල යුතුවේ. කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුවේ අදාල කටයුතු 2019 දෙසැම්බර් 31 දිනට සියයට 15 සිට සියයට 96 දක්වා පරාසයක මන්දගාමී ප්‍රගතිය දක්වා තිබුණි. ව්‍යාපෘති කාලය 2020 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 3කදී දීර්ඝකර තිබුනද ණය ගිවිසුම් යටතේ කරන ලද එ.ජ.ඩො මිලියන 25ක ඉතිරි ප්‍රතිපාදන භාවිතයෙන් ණය අවසන් දිනය වන දෙසැම්බර් 31 දිනට අදාල කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබද සැකයක් පවතී. | (අ)<br><br><br><br><br><br><br><br>(ආ) | ව්‍යාපෘතිය දීර්ඝ කරන ලද කාලය තුලදී ව්‍යාපෘතියේ කටයුතු සහ අපේක්ෂිත අරමුණු ලබාගත නොහැකි වේ.<br><br>ණය කාලය අවසන් දිනය වන 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්තමාන ණය මුදල සම්පූර්ණයෙන් වියපැහැදම් කිරීමට නොහැකි වීමේ අපේක්ෂිත අවධානමක් පවතී. | ව්‍යාපෘති කලමණාකරන ඒකකය සහ අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුව සමග 2020 දෙසැම්බර් 31 දිනට පෙර ඉතිරි වැඩ අවසන් කිරීමට හැකි පිවිසුමක් පිළිබදව වර්තමානයේ සාකච්ඡා කරමින් පවතී. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

## 3.2 නිෂ්කාර්ය සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| පාරිසරික රසායනාගාරයේ රසායනාගාර අයිතමයන් වර්ෂ 03 ක් පුරා භාවිතයට නොගෙන පැවතුණි. | (අ) අවභාවිතයක් සිදුවිය හැකිය.<br>(ආ) විදේශ ණය මුදල් නාස්ති වීමක් සිදුවේ. | කොළඹ මහ නගර සභාව විසින් ඔවුන්ගේ පරික්ෂා කිරීමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන කරන ලද ඉල්ලීම් මත තොග අයිතමයන් නිකුත් කර ඇත. | හේතු විමර්ෂණයට සහ වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට පියවර ගත යුතුය. |

## 3.3 පාරිසරික කරුණු සම්බන්ධ ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිරික්ෂණ |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව පාරිසරක තක්සේරු නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | පරිසර නියාමන අවශ්‍යතාවය සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා තාවකාලික විධිවිධාන යොදා ඇත. පුරප්පාඩුව පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| | කාර්ය මණ්ඩල තනතුරු | 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | | | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| 01. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක (ඉංජිනේරු) | 02 | 01 | 01 | ව්‍යාපෘතියේ කටයුතු වල සුමට ක්‍රියාකාරිත්වය ට බලපානු ඇත. | උපලේඛණයේ දක්වා ඇති පරිදි සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙනම කාර්යමණ්ඩලයක් නොමැත. ව්‍යාපෘතියේ සියළුම කටයුතු මහ කොළඹ ජලය සහ අපජල කළමණාකරන වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන සහ මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතියට අනුයුක්ත කාර්යමණ්ඩලය විසින් සිදුකරනු ලබයි. | ප්‍රධාන තනතුරු පුරප්පාඩු 12 පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| 02. | ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | - | 01 | | | |
| 03. | ව්‍යාපෘති ඉංජිනේරු | 10 | 07 | 03 | | | |
| 04. | පරිසර නිලධාරි | 01 | - | 01 | | | |
| 05. | ව්‍යාපෘති ලේකම් -1 | 02 | 01 | 01 | | | |
| 06. | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු-II | 07 | 05 | 02 | | | |
| 07. | කළමණාකාර සහකාර -II | 05 | 03 | 02 | | | |
| 08. | ඉදිකිරීම් කළමණාකරු | 02 | 01 | 01 | | | |
| | | 30 | 18 | 12 | | | |